**සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම - 2015**

---------------------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට සීමාසහිත මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

නැගෙනහිර මූලස්ථාන කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ශේෂය දෙවරක් ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විකුණුම් පිරිවැය රු.2,224,434 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව, ස්ථාවර වත්කම් (ප්‍රධාන කාර්යාලය) සඳහා ක්ෂය රු.44,033,592 ක් විය. කෙසේ වුවද, උපලේඛනයේ එය රු.45,514,877 ක් ලෙස දක්වා තිබුණි. රු.1,481,285 ක් වූ වෙනස සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| (i) 4.2.2 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සෑම මාසයකම පැවැත්විය යුතු වුවත් 2015 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ii) 5.2 වගන්තිය | සමාගම විසින් 2015 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි. |
| (iii) 7.4.2 වගන්තිය | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව සභාපති/ප්‍රධාන විධායක නිලධාරී විසින් සභාපතිත්වය දැරිය යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින 05 කට පෙර රැස්විය යුතුය. කෙසේ වුවද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව 2015 වර්ෂය තුළදී රැස්වී නොතිබුණි. |
| (ආ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 4.2.1 මාර්ගෝපදේශය | 2015 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සමාගම විසින් පිළියෙල කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.106,271,865 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.132,874,402 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,602,537 ක හෙවත් සියයට 20 ක පිරිහීමක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම රු.237,985,165 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

2015 වර්ෂය සඳහා සමාගමේ මූලස්ථාන කාර්යාලවල මූල්‍ය ප්‍රකාශන අනුව, පහත සඳහන් මූලස්ථාන කාර්යාල 3 සමාලෝචිත වර්ෂය සඳහා පාඩු පිට පවත්වාගෙන ගොස් තිබුණි.

| මූලස්ථාන කාර්යාලයේ නම | වර්ෂය සඳහා පාඩුව |
|---|---|
| | රු. |
| පොලොන්නරුව | 1,796,503 |
| ඌව | 14,468,497 |
| දකුණ | 2,046,790 |

### 3.3 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කිසිදු පියවරක් ගැනීමෙන් තොරව රු.2,654,978 ක් වටිනා අවලංගු කළ චෙක්පත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) මූලස්ථාන කාර්යාලය විසින් වර්ෂය මුළුල්ලේම බැංකු ජංගම ගිණුමේ තබා තිබූ රු.මිලියන 1 ක් පමණ වූ එහි අතිරික්ත මුදල් ආදායම් උපයන ප්‍රභවයක ආයෝජනය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

සමාගමේ උපායමාර්ගික ක්‍රමයක් සඳහා සමාගම විසින් මධ්‍යකාලීන සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව, මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාගම විසින් දළ වශයෙන් දින 105 ක ප්‍රමාදයකින් පසුව 2016 ජුනි 14 දින මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. තවද 2015 වර්ෂය සඳහා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2017 ජනවාරි 16 දින ඉදිරිපත් කර තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ණයගැතියන් හා ලැබිය යුතු මුදල් පිළිබඳ පාලනය | ණයගැති ශේෂයන් හා ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට සමාගම විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. |
| (ආ) මූල්‍ය කළමනාකරණය | බැංකු ජංගම ගිණුම්වල හිතකර ශේෂයන් දිගු කාලයක් නිෂ්කාර්යව තිබෙන්ට ඉඩ හැර තිබුණි. |